**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ යේ මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.429,965,870ක් වුවද, 2023 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.429,777,176ක් වූයෙන් රු.188,694ක් නොසැසඳීමක් පැවතුණි. | වර්තමානයේ මාසික සාරාංශ පිළියෙල කර එම වෙනස ගැලපීමට පියවර ගෙන ඇති බව. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම එම කාලයට අදාල මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කළ යුතුය. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වත්කම් 50ක එකතුව රු.2,328,829ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස නොදැක්වීමෙන් වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වර්තමානයේ නිවැරදි කර ඇති අතර ඉදිරියේදී නියමිත කාලපරිච්ඡේදයේ Cigas මෘදුකාංග පැකේජයේ ලේඛනගත කිරිමට පියවර ගෙන ඇති බව. | -එම- |
| (ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ස්ථාවර වත්කම් 30ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතින බව. | ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක සමෘද්ධි බැංකු විසින් ලබාදුන් විවිධ වර්ගයේ ණයවලින් 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 1413කගෙන් ණය වාරික 03 ක සිට 09 ක් දක්වා සංඛ්‍යාවක් අයකර නොමැති හිඟ ණය ශේෂය රු.62,424,236ක් බව නිරීක්ෂණය විය. | රු.62,424,236ක හිඟහිටි ශේෂය මුළු හිඟණය ශේෂය සමග සැසඳීමේදි සියයට 1.87ක් පමණක් විය. දෙපාර්තමේන්තු උපදෙස් අනුව මෙම ප්‍රතිශතය සියයට 5කටත් වඩා අඩුවිය යුතු වේ. කෙ සේ වෙතත්, අදාල කල් ඉකුත් වූ ශේෂ අයකර ගැනිමට පියවර ගෙන ඇති බව. | හිඟහිටි නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමෘද්ධි බැංකුවට ප්‍රතිලාභ මුදල් ලැබී දින 03ක් ඇතුළත කඩිනමින් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට තැන්පත් කළයුතු වුවත්, සමෘද්ධි බැංකු 05ක් විසින් එකතුව රු.773,809,070ක් දින 01 සිට දින 75ක් දක්වා කාල ප්‍රමාදයකින් පසු ප්‍රතිලාභීන්ගේ ගිණුම්වල මුදල් තැන්පත් කර තිබුණි. | සමාජ සුභසාධන ගෙවීම්වලට අදාලව ගෙවීම් සිදුකළ යුතු අය ගේ ලැයිස්තුවේ වෙනස්කම් කළයුතු බැවින් හා ග්‍රාම සේවක නිලධාරීන්ගේ දත්ත ප්‍රකාරව සමාජ සේවා ශාඛාව විසින් යාවත්කාලීන කළ ලැයිස්තුව ලබාදීමෙන් පසු ප්‍රතිලාභීන්ට ගෙවීම් සිදුකර වර්තමාන යේ නිරවුල් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාල යේ ප්‍රතිලාභීන්ගේ ගිණුමේ මුදල් තැන්පත් කිරීමට පියවර ගතයුතුය. |

## 2.2 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 නොවැම්බර් 07 දිනැති අංක HAF/1/1/Duty/Vol–II දරන ලිපිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක සේවය කරන නිලධාරීන් 22ක් මාසික ඉදිරි වැඩසටහන්, එහි වෙනස්වීම් සහ දෛනික සටහන් පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදි සිදුනොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදි තිබු බව. | නියමිත උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | පුද්ගලයින් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුවේ 2023 අප්‍රේල් 11 දිනැති අංක DRP/OP/01/DS/03 (iv) දරන ලිපිය | තෙන්මාරාච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමසේවක නිලධාරීන් විසින් හැඳුනුම්පත් සැකසීමට අදාලව අයදුම්කරුවන්ගෙන් අයකළ ගාස්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත භාර නොදී දින 11 සිට දින 365ක් දක්වා කාල සීමාවක් ග්‍රාමසේවක නිලධාරීන් භාරයේ තබාගෙන තිබුණ බව නිරීක්ෂණය විය. | මෙවැනි ගැටළු වර්තමානයේ නිරවුල් කර ඇති බව. | රැස්කරන මුදල් නොපමාව තැන්පත් කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි 1වැනි කොටසේ XV පරිච්ඡේදයේ 214 වගන්තිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින්, සේවය හැරගිය නිලධාරීන් 08ක් සම්බන්ධයෙන් කාලීනව කටයුතු නොකර, සේවය හැරගිය දිනෙන් පසු දින 38 සිට දින 677ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | ඉදිරියේදී නියමිත කාල පරිච්ඡේදය තුළ එම කටයුතු සිදුකිරිමේ වැඩපිළිවෙලක් ස්ථාපිත කර ඇති බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නැවත පදිංචි කිරීම් නිවාස පහසුකම් සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ 2016 සහ 2021 වර්ෂවල ක්‍රියාත්මක කළ රු. මිලියන 1ක හා රු. මිලියන 0.6ක නිවාස යෝජනා ව්‍යාපෘතිවලින් රු. මිලියන 1ක්වූ ව්‍යාපෘති ප්‍රතිලාභීන් 1,458කගේ සහ රු. මිලියන 0.6ක නිවාස ව්‍යාපෘති ප්‍රතිලාභීන් 234කගේ නිවාස ඉදිකිරීමේ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණයෙන් අවසන් වී නොතිබුණද, එකතුව රු.65,958,938ක්වූ සියළුම ගෙවීම් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට බැර කර එම මුදල් ආපසු ලබාගත නොහැකි අයුරින් ස්ථාවර නියෝග මගින් අත්හිටුවා තිබූ බව නිරීක්ෂණය විය. | ගෙවීම් සම්පූර්ණයෙන් නිදහස් කිරීමට පියවර ගෙන ඇති බව. | ඉදි කිරීම් සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 137, 138 හා 237(ආ)(1) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, විධිමත් පරීක්ෂාවක් කර ඒ අනුව කටයුතු කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |

## 2.4 තැන්පතු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති සඳහා වැය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබී තිබූ එකතුව රු.20,996,124ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග නොගෙන වර්ෂ 06ක කාලයක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | මලාපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය අවසන් කර ඇත. එම ගෙවීම් පියවීම් සම්බන්ධ කමිටුවක් ස්ථාපිත කර ඇති අතර ඉතා ඉක්මනින් මේවා පියවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | වියදම් පියවීම සඳහා ලැබී තිබූ තැන්පතු මුදල් නියමිත කාලවකවානුව තුළ අදාල පාර්ශව වෙත ආපසු ගෙවීමට පියවර ගත යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ඇප තැන්පතු සහ තෙවැනි පාර්ශවයට ගෙවිය යුතු එකතුව රු.1,988,459ක් වර්ෂ 02කට අධික කාලයක සිට මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග නොගෙන තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | අදාල කාර්යයන් අවසන් වූ වහාම ඇප මුදල් නිදහස් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව පියවර ගත යුතුය. |

## 2.5 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන වැය විෂයන් 10ක සියයට 3 ක සිට සියයට 95ක් දක්වා පරාසයකින් එකතුව රු.32,654,000ක ඉතිරිවීම් මූලික ප්‍රතිපාදනයෙන් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි. එසේම, මූලධන වැය විෂයන් 08ක් සඳහා මූලික ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 1,700ක් දක්වා පරාසයකින් එකතුව රු.32,104,000ක් වෙනත් වැය විෂයන්වලින් මාරුකර තිබුණි. | ඉදිරියේදී පුනරාවර්තන ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස හසුරුවා විචලනයන් අවම කිරීමට පියවර ගෙන ඇති බව. | වියදම් ඇස්තමේන්තු විධිමත්ව සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 2.6 වැඩිපුර ගෙවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිශිෂ්ඨයේ 9 වගන්තිය ප්‍රකාරව, නිවාඩු දින වැටුප් ගෙවීමට අදාල පැය ගණන සාමාන්‍ය රාජකාරි ඉටුකරන කාලය පදනම් කරමින් පමණක් ගණනය කළයුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක සේවය කරන නිලධාරීන් 73ක් සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව රාජකාරියට වාර්තා කර තිබුණද, ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව ඔවුන්ට නිවාඩු දින වැටුප් ගෙවා තිබීමෙන් එකතුව රු. 1,763,047ක වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ උපදෙස් අනුව වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමට තිරණය කර ඇති බව. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 සහ 2020 වර්ෂවල පිළිවෙලින් වෙනත් අමාත්‍යාංශ දෙකක් විසින් ලබාදී තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් 2021 වර්ෂය අවසන් වනවිට එකතුව රු.196,039,247ක් වැය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මට්ටුවිල් ආර්ථික මධ්‍යස්ථානය ඉදිකර තිබූ නමුත් එම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | ආර්ථික මධ්‍යස්ථානයේ මෙහෙයුම් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති බව. | එම ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල උපයෝජනය කිරිමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විවිධ ව්‍යාපෘති සඳහා ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී ඇති එකතුව රු.1,689,853ක් අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | එම තැන්පතු මුදල් උපයෝජනය කිරීමට කටයුතු කර ඇති බව. | තැන්පතු මුදල් අදාල අරමුණු සඳහා උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | වඩමාරච්චි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විවිධ අමාත්‍යාංශ හා රාජ්‍ය නොවන ආයතන විසින් රු. මිලියන 41.6 ක් වැයකර ඉදිකළ ගොඩනැගිලි 08ක් පසුගිය වර්ෂ 17කට අධික කාලයක් උපයෝජනය කිරීමකින් හා නඩත්තුවකින් තොරව පැවැති බව නිරීක්ෂණය විය. | වඩමාරච්චි නැගෙනහිර විවිධ සේවා සමූපකාර සංගමයේ හාල් මෝල, වඩමාරච්චි නැගෙනහිර විවිධ සේවා සමූපකාර සංගමයට භාරදී තිබූ අතර අනෙකුත් ඒවා ක්‍රියාත්මක වන බව. | අදාල ගොඩනැගිලි, ඒවා ඉදිකළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරිමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.56,640,750ක් වැය කර 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කිරි පාස්චරීකරණ ව්‍යාපෘතිය සඳහා උපකරණ මිලදී ගැනීම සහ ගොඩනැගිලි ඉදිකිරීම් යන ව්‍යාපෘති දෙකම 2019 වර්ෂයේ නිමකිරීමට සැලැසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිම කර නොතිබුණි. | එම ගොඩනැගිලි ඉදිකර අවසන් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය 2024.07.02 දින කෘෂිකර්ම අමාත්‍යාංශයට යවා ඇති බව. | සැලසුම් පරිදි ව්‍යාපෘති නිමකර වත්කම් උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරිමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් වෙන් කළ රු.75,323,600ක් වූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ මලාපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් එම ව්‍යාපෘතිය සඳහා රු.65,955,381ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | එම ගෙවීම් පියවීමට කමිටුවක් ස්ථාපිත කර ඇති අතර කඩිනමින් මේවා නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. තවද, ජාතික ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලයේ සහාය සහිතව එම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට කටයුතු කරමින් පවතින බව. | විධිමත් වැඩපිළිවෙලක් සකසා ව්‍යාපෘතිය සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් රු. 199,424,247ක් වටිනා වත්කම් 04ක් පරිහරණය කරනු ලබන නමුත් ඒවා පවරා ගැනිමට පියවර ගෙන නොතිබුණි. | තෙන්මාරාච්චි ඉඩම් පවරා ගැනිමේ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින අතර වඩමාරච්චි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් සම්බන්ධයෙන් මිනුම් දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස්වරයා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ආදියට ලිපි යවා ඇති බව. | විධිමත් පරිදි කටයුතු කර වත්කම් පවරා ගැනිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සමස්ථ අනුමත කළ කාර්ය මණ්ඩලය 2,085ක් වුවත්, තථ්‍ය කාර්ය මණ්ඩලය 2,594ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේ අනුමත තනතුරුවල පුරප්පාඩු 244ක් වූ අතර, ප්‍රාථමික, ද්විතියික හා තෘතියික මට්ටමේ නිලධාරීන්ගේ අතිරික්තය 771ක් විය. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර තිබූ නමුත් පුරප්පාඩු මේ දක්වා පුරවා නොතිබුණි. තෘතියික හා ද්විතියික මට්ටමේ තනතුරුවල අතිරික්ත කාර්ය මණ්ඩලය සහ ස්ථාන මාරු පිළිබඳව 2021 වර්ෂයේදී ලිපි 02ක් මගින් දැනුම්දී තිබුණත්, මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම, 2020 හා 2021 වර්ෂවල පත්වීම් ලබාදුන් සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය මණ්ඩලය ස්ථාපිත කිරීම අනුමත කර නොතිබුණි. එසේම, බහුකාර්ය සංවර්ධන බලඇණිය මගින් පත්කළ සේවකයින්ට මේ වන තුරු පත්වීම් ලිපිද ලබාදී නොතිබුණි. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදුකර අවශ්‍යතාවය මත පුරප්පාඩු පිරවීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩලය පුරප්පාඩු පවතින වෙනත් ආයතන වෙත විධිමත් පරිදි අනුයුක්ත කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි එක් සේවා ස්ථානයක සේවය කළ හැකි උපරිම සේවා කාලය වර්ෂ 05ක් ලෙස සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක නිලධාරීන් 99ක් වර්ෂ 06 ක සිට වර්ෂ 23ක් දක්වා කාලපරිච්ඡේදයක් එකම සේවා ස්ථානයක සේවය කර තිබුණ බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථානමාරු කිරීම් සිදුකර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව ස්ථාන මාරු කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙනත් අමාත්‍යාංශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් නිලධාරීන් 07කට ලබාදුන් ස්ථාන මාරු නියෝග මාස 01 ක සිට 13ක් දක්වා කාලපරාසයක් ඉකුත් වී තිබූ නමුත් 2024 ජනවාරි 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | එම නිලධාරීන් සඳහා ස්ථාන මාරු ඒ ඒ අමාත්‍යාංශ විසින් සිදුකරනු ලබන බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටි රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |